**මීරිගම ප්‍රාදේශීය සභාව**
**ගම්පහ දිස්ත්‍රික්කය**
**-------------------**

**1. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 08 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 12 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මීරිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | --------------- | --------------------------- |
| (i) | ප්‍රධාන කාර්යාලය පුළුල් කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම රු.530,026 ක් සහ නිල්දිය සෙවන ප්‍රජාශාලාවේ ඉදිකිරීම් වටිනාකම රු.485,322 ක් අඩුවෙන් ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට ඇතුලත්කර තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළයුතු වේ. | 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ඉඩම් සහ ගොඩනැගිලි ගිණුමට රු.104,769,917 ක මෝටර් රථ හා කරත්ත ඇතුලත්කර තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළයුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | යන්ත්‍ර හා උපකරණ ගිණුමේ බේලින් යන්ත්‍රයේ වටිනාකම රු.32,500 ක් දෙවරක් සටහන්කර තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළයුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | පැවරුම් නියෝග හා ලිපි මගින් ලද ඉඩම් 09 ක වටිනාකම රු.3,167,377 ක් හා රු.119,059,633 ක් වූ අමතර වටිනාකමක්ද ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට ඇතුලත්කර තිබූ අතර පූර්ව වර්ෂ වල ගිණුමෙන් ඉවත් කළ රු.13,349,430 ක වටිනාකම දෙවරක් ගිණුමෙන් ඉවත්කර තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළයුතු වේ. | 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂයේ රු.2,385,000 ක් වූ වැටුප් ප්‍රතිපූර්ණ හා දේපල ණය පොලී රු.277,362 ක් හිඟහිටි ප්‍රාග්ධන ආදායම් ගිණුමට ඇතුලත්කර තිබුණි. | වැටුප් ප්‍රතිපූර්ණ සහ දේපල ණය පොලී වෙන වෙනම ගිණුම්ගත කළයුතු වේ. | එම ගිණුම් 2හි ශේෂයන් ලෙස 2019 වර්ෂයට ඉදිරියට ගෙන ගොස් ඇති බව දන්වමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලද රු.251,674 ක ආයුර්වේද බෙහෙත් තොගයක් ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායකවීමේ ගිණුමකට ඇතුලත්කර නොතිබුණි. | පරිත්‍යාග ලෙස ගිණුම්ගත කළයුතු වේ. | ආයුර්වේද බෙහෙත් තොගයක් ලැබී ඇති අතර,එය නිවැරදිව ගිණුම්ගත කර තිබුණි. |
| (vii) | අවසන් ගිණුම අනුව දක්වා ඇති ගිණුම් විෂයයන් 06 ක ශේෂ හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.131,682,956 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | ගිණුම් හා උපලේඛණ අතර වෙනස් කම් ඇති නොවන සේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4** <u>ලැබිය යුතු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 06 ඉක්මවූ හඳුනා නොගත් රු.21,429,518 ක ණය ශේෂයක් හා වසර 05 ඉක්මවූ රු.2,165,538 ක ණය ශේෂයක්ද නිරවුල්කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | එම ශේෂය හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**1.5** <u>අනුකූල නොවීම්</u>

<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

| | **නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | | | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|---|
| | **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන | | වර්ෂ 05 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් | නව තක්සේරු ලබාගෙන ඒ | දිස්ත්‍රික් තක්සේරුකරු වෙත |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පිළිබඳ විශේෂ විධිවිධාන පනත | | වරිපනම් බදු අයකිරීම සඳහා තක්සේරුවක් කර ගතයුතු වුවත් 2008 පසු ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අනුව කටයුතු කළයුතු වේ. | 2015 අප්‍රේල් 20 දිනැති ලිපිය මගින් ඉල්ලීම් කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 26,949,249 | වර්ෂ 02 ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | වර්ෂ 2 ඉක්මවූ තැන්පතු ශේෂ හඳුනා ගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,943,365 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,448,237 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 13,440,000 | 9,653,644 | 8,959,587 | 694,057 | 14,130,000 | 9,675,055 | 9,257,003 | 418,052 |
| කුලී | 23,110,000 | 25,286,804 | 22,964,510 | 2,322,294 | 15,895,000 | 14,946,236 | 14,523,136 | 423,099 |
| බලපත්‍ර ගාස්තු | 2,163,350 | 1,082,950 | 1,082,950 | - | 1,896,100 | 1,238,600 | 1,238,600 | - |
| වෙනත් ආදායම් | 267,245,850 | 1,808,253 | 1,812,253 | (3,999) | 221,894,000 | 1,018,058 | 1,017,768 | 290 |

### 2.2.2 <u>වරිපනම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් කාල විශ්ලේෂණය අනුව වසර 1 සිට 3 දක්වා රු. 1,291,805 ක්, වසර 3 සිට 5 දක්වා රු.388,882 ක්, වසර 05 සිට 10 | හිඟ වරිපනම් අයකිරීමේ කටයුතු කාර්යක්ෂම කළයුතු වේ. | අදාල ක්‍රියාමාර්ග ගෙන හැකි ඉක්මනින් අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | දක්වා රු.2,566,921 ක් හා වසර 10 ට වැඩි රු.574,662 ක් සභාවට අයකර ගතයුතුව පැවතුණි. | | |
| (ii) | සමාලෝචිත වර්ෂයට වරිපනම් හා බදු ආදායම ලෙස රු.13,440,000 ඇස්තමේන්තු කර තිබුණු අතර බිල්කල ආදායම රු.69,653,644 ක්ද රැස්කල මුදල රු.8,959,587 ක්ද විය. | හිඟ වරිපනම් අයකිරීමේ කටයුතු කාර්යක්ෂම කළයුතු වේ. | බිල්කල ආදායමට අනුරූපව අයවැය සැකසීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

**2.2.3** <u>බලපත්‍ර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ---------------------------------- |
| 2018 වර්ෂය වෙනුවෙන් වෙළඳ ආයතන 1,729 ක් සඳහා බලපත්‍ර ලබාදීමට අයදුම්පත්‍ර මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය වෙත යොමුකර තිබුණද, මින් අනුමත වී ආපසු ලැබී තිබුණේ අයදුම්පත්‍ර 1,426 ක් පමණි. | බලපත්‍ර ලබාදීමේ කටයුතු කාර්යක්ෂම කළයුතු වේ. | ඉදිරියේදී එම නිර්දේශ නොපමාව ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කරන බව දන්වමි. |

**2.2.4** <u>වෙනත් ආදායම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | ----------------------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේදී කුළුණු 32 කින් රු.96,000 ක මුදලක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | මුදල් අයකර නොගත් සම්ප්‍රේෂණ කුළුණු වලින් මුදල් අයකිරීමට කටයුතු කළයුතු වේ. | අදාල මුදල් අයකිරීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ii) | වෙළඳ බලපත්‍ර ඒකක සංඛ්‍යා හැර අනෙකුත් ආදායම් ප්‍රභවයන්ගේ ඒකක සංඛ්‍යාව 2016 වර්ෂයට වඩා අඩුවී තිබුණි. | ආදායම් ප්‍රභවයන්ගේ ඒකක ප්‍රමාණය වැඩිකර ගතයුතු වේ. | සමීක්ෂණයක් සිදුකර වරිපනම් ඒකක සංඛ්‍යාව , නව ව්‍යාපාර, පරිසර බලපත්‍ර ලබාගතයුතු ආයතන වැඩිකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 15 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතු වේ. | වාහන නැවතුම් ස්ථානයක් සඳහා අතුරු ව්‍යවස්ථාවක් පැනවීමට අනුමැතිය සඳහා පලාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යවා ඇති බව දන්වමි. |

## (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් 15 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉටුකළයුතු සියලු කර්තව්‍යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කළයුතු වේ. | පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## (ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කසළ බැහැර කරන භූමියට පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළයුතු වේ. | පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවන බව මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රකාශ කරන ලදී. |
| (ii) | කසළ බැහැර කරන ඉඩම සඳහා පූර්ව වර්ෂයේදී රු.2,000,000ක් ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.4,468,000 ක් විය. ඒ අනුව කසළ බැහැර කරන ඉඩමට ගෙවන මුදල සියයට 123.4 කින් වැඩිවී තිබුණි. මේ සම්බන්ධයෙන් සභාව විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි. | කසළ බැහැර කිරීමේ ක්‍රමවේද කාර්යක්ෂම කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත්කර නොමැත. |

(ඈ) **මහජන පැමිණිලි**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාවට ලැබී තිබූ මහජන පැමිණිලි 431 කින් 218 ක් විසඳා නොතිබුණි. | මහජන පැමිණිලි කඩිනමින් විසඳීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මහජන පැමිණිලි ඉතා ඉක්මනින් විසඳීමට කටයුතු කරන බව දන්වමි. |

**(ඉ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන ඉලක්ක අරමුණු ඉටුකරගැනීම සඳහා දිගුකාලීන සැලසුම් සකස්කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයටද තිරසර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගතයුතු වේ. | 2019 වර්ෂයට අදාලව ද එම කටයුතු ක්‍රියාත්මක කරන බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **කඩ කාමර භෞතික පරීක්ෂාව** | | |
| 2018 නොවැම්බර් 09 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවට අනුව මීරිගම සුමනසාර මාවතේ සභාව දෙසට දකුණුපස,ඉදිකර තිබූ කඩ කාමර 17 ට අමතරව එම ඉඩමේ පළමු කඩය සහා අනුමැතියකින් තොරව ඉදිකරන ලද කඩ කාමරයක් බව නිරීක්ෂණය විය. කඩ කාමර පේළිය අවසන් වන ස්ථානයේ ද තාවකාලික කඩයක් ඉදිකර තිබුණි. මෙම කඩ කාමර ඉදිකර ඇති භූමිය සභාව සතු නිරවුල් දේපලක් බවට ලිඛිත සාක්ෂි නොතිබුණි. | සභාව සතු වත්කම්වල අයිතිය හා ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කළයුතු වේ. | එය නීත්‍යානුකූලව සභාව සතුකර ගැනීමට පියවර ගන්නා බව දන්වමි. ඉන් අනතුරුව අනුමැතියකින් තොරව ඉදිකර ඇති කඩකාමර සඳහා අදාල ලියවිලි ලබාගෙන අනුමැතිය ලබාදීමට කටයුතු කරමි. කඩ කාමර පේලියේ අවසානයේ ඇති තාවකාලික කඩ කාමරයන් ඉවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ආ) සභා බල ප්‍රදේශයේ ඉදිකර ඇති කඩ කාමර 20 ක් පමණ සභා අනුමැතියකින් හා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියකින් තොරව බදු කරුවන් විසින් මූලික ගොඩනැගිලි සැලැස්ම වෙනස් කර ඉදිකිරීම් කර තිබුණි. | සභාව සතු වත්කම් වල අයිතිය හා ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කළයුතු වේ. | නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියට යටත්ව ගොඩනැගිලි සැලසුම් අනුමත කර නීත්‍යානුකූලභාවයට පත්කරන බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>ආදායම් පරීක්ෂක තනතුරු දෙකක් 2006 හා 2013 වර්ෂ වල සිටද, පෙර පාසල් ගුරු තනතුරු 02 ක් 2014 වර්ෂයේ සිටද සෞඛ්‍ය පරිපාලක තනතුර 2012 සිටද 2017 වර්ෂයේ සිට පවතින වැඩ ක්ෂේත්‍ර කම්කරු 07 ක්ද ඇතුළුව තනතුරු 20 ක් 2018 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළයුතු වේ. | පෙර පාසැල් ගුරු තනතුරු 02 ඉදිරියේදී විවෘත බඳවා ගැනීමක් මගින් පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව දන්වමි.සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා බඳවා ගැනීම් සිදු නොකරනලදි.වැඩ ක්ෂේත්‍ර කම්කරු හා අනෙක් තනතුරු සඳහා විවෘත බඳවා ගැනීමක් සිදුකර නැවත බඳවා ගන්නා ලෙස දන්වා ඇත. |
| (ආ) | **සේවක ණය**<br>සේවය හැරගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් රු.154,903 ක් ද, ස්ථාන මාරුවී ගිය නිලධාරියෙකුගෙන් රු.78,500 ක් හා මියගිය නිලධාරියෙකුගෙන් රු.131,200 ක්ද අයවිය යුතුව තිබුණි. | හිඟ සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පොළ භූමියේ ඉදිරියෙන් අනවසරයෙන් කඩ 06 ක් සහ මිරිස් මෝලක් සහිත කාමරයක් ඉදිකර තිබුණි. | අනවසර ඉදිකිරීම් වැලැක්වීමට කටයුතු කළයුතු වේ. | සානුකම්පිකව සලකා බලා සතිපොල භූමියේ ඉදිරියේ වෙළඳාම් කටයුතු කරගෙන යාම සඳහා උපදෙස් ලබා දී ඇත. |
| (ආ) | සභාවට අයත් කඩ කාමර 306 අතරින් 2019 මැයි 31 දිනට කඩ කාමර 115 ක් සඳහා පමණක් බදු ගිවිසුම් තිබුණු අතර වෙළඳපල හා කඩ කුලී හිඟ ශේෂය රු.1,528,050 කි. | බදු ගිවිසුම් අත්සන් කිරීමට හා හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | අනෙක් කඩ කාමරවල ගිවිසුම්ද අත්සන් කර ගැනීමට කටයුතු කරමි. වෙළඳපල හා කඩකුලී හිඟද මේ දිනවල අයකර ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |
| (ඇ) | මීරිගම ප්‍රාදේශීය සභාව සතු පොදු ඉඩම් 142 ක් පැවති අතර මෙම ඉඩම් වල වැට මායිම සකස් කර ආරක්ෂිත වැටවල් යොදා අයිතිය තහවුරු කර ගැනීමට සභාව කටයුතුකර නොතිබුණි. | පොදු ඉඩම්වල ආරක්ෂාව සහ අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළයුතු වේ. | වැටමායිම් සකස්කර, වැටවල් යොදා අයිතිය තහවුරු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------ | ------------ | ------------------- |
| ස්ථාවර වත්කම් ලේඛනය අනුව වටිනාකම රු.2,085,182 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 21 ක් සඳහා ඔප්පු ලබා ගැනීමට හෝ පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සඳහා ඔප්පු මගින් අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉඩම් හා ගොඩනැගිලි 21ක් සඳහා ප්‍රකාශන ඔප්පු මගින් අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.5.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබානොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------ | ---------------- | ----------------- |
| පල්ලෙවෙල සතිපොළ 2014 මැයි 13 සිට 2018 ඔක්තෝබර් 28 දක්වා වසර 04 ක කාලයක් වසා දමා තිබුණි. | සතිපොළ පවත්වාගෙන යාමට කටයුතු කළයුතු වේ. | 2018 නොවැම්බර් මස සිට මේ දක්වා සතිපොළ සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ. |

### 3.5.3 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------ | --------------- | ----------------- |
| පල්ලෙවෙල පැරණි ආයුර්වේද ගොඩනැගිල්ල පිහිටි ඉඩම හා තලහේන පෙර පාසල පිහිටි ඉඩම සභාවට ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි. | දේපල සභාවට පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කර ඇති බව දන්වමි.එහෙත් මේ දක්වා අපවෙත පවරා දී නොමැති බවද දන්වමි. |

### 3.5.4 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------- | --------------- | ------------------- |
| 2018 දෙසැම්බර් 31 දිනට පුස්තකාල සමීක්ෂණ වාර්තාව අනුව අස්ථානගත වී තිබූ වටිනාකම රු.15,063 ක් වූ පොත් 81 ක් සහ පාවිච්චියට ගත නොහැකි ඉවත්කල යුතු වටිනාකම රු.41,185 ක් වූ පොත් 338 ක් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමටද ඉවත් කළයුතු පොත් ඉවත් කිරීමටද කටයුතු කළයුතු වේ. | අස්ථානගත වී තිබු පොත් වටිනාකම අදාල නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බවත්, ඉවත් කලයුතු පොත් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත් දන්වමි. |

### 3.5.5 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව සතු රු.4,999,500 ක වටිනාකමැති බැකෝලෝඩර යන්ත්‍රය 2014 අප්‍රේල් 20 දින සිට අක්‍රියව පවතින අතර අළුත්වැඩියා කර ප්‍රයෝජනයට නොගෙන ප්‍රාදේශීය සභා පරිශ්‍රය තුල දිරාපත් වෙමින් තිබුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. | පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර වෙන්දේසි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා වැය විෂයයන් 10 කට ඇස්තමේන්තු කරන ලද රු.100,600,000 ක අයවැය ප්‍රතිපාදනය ඉක්මවා රු.13,250,802 ක් වැයකර තිබුණි. | අපේක්ෂිත කාර්යයන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගතයුතු වේ. | ඉදිරියේදී අයවැය සකස් කිරීමේදී පසුගිය සත්‍ය වියදම් ද සලකා බලා ඉතාමත් නිවැරදි ආකාරයට අයවැය ඇස්තමේන්තු සකස් කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද වැය විෂයයන් 44 කට අදාලව රු.16,360,700 ක් සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබීම හා වැය විෂයයන් 71 කට අදාලව රු.43,504,920 ක් සියයට 20 සිට සියයට 97 දක්වා ඉතිරිව තිබුණි. | අවශ්‍යතාවය මත පමණක් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළයුතු වේ. | නිවැරදි අයවැයක් සැකසීමට පෙර සභාවේ අරමුණු හා පරමාර්ථ නිවැරදි ලෙස හඳුනාගෙන අදාල නිලධාරින් පුහුණු කරවා ,ඵලදායි අයවැය ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |